10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

## ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

### 2.1 විවිධ චලන අභ්‍යාසයන්හි යෙදෙයි.

රංග අභ්‍යාස කිරීමට සුදුසු ඇඳුමක් ගෙන එන ලෙස පෙර දිනක දන්වා එය ඇඳ ගැනීමට මිනිත්තු කිහිපයක් කාලච්ඡේදයෙන් ලබා දෙනු ලැබේ. මුලින් සූදානම්වන ශිෂ්‍යන් සමග පන්ති කාමරයේ ඉඩකඩ අවශ්‍ය පරිදි සකස් කර ගැනීම සිදු කරයි. එය ද යම් උණුසුම් කිරීමේ අභ්‍යාසයක් ලෙස ක්‍රීඩාවක් ලෙස සිදු කරයි. සූදානම්ව පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ක්‍රමයෙන් එම ක්‍රීඩාව සමග සම්බන්ධ වේ.

සියලු සිසුන් පන්ති කාමරයට පැමිණි පසු පිරිස අවකාශයේ ඇවිදවීමේ යොදවන අතර, විවිධ විධානයයන් යටතේ ඉඳ ගැනීම, සිට ගැනීම ඇවිදීම, නතරවීම, උඩ පැනීම ආදී ක්‍රියාවන්වල නිරත කරවයි. එය අවධානය රඳවා ශිෂ්‍යයන් පන්ති කාමරයේ කටයුත්තට යොමු කර ගැනීම සඳහා සිදු කරනු ලබන්නකි.

ඉන් පසුව පිරිස සමානව කණ්ඩායම් දෙකකට බෙදනු ලැබේ. එක් කණ්ඩායමක් නිරීක්ෂණය කිරීමට යොමු කරන අතර අනෙක් කණ්ඩායමට අවකාශයේ ඇවිදීමට පවරයි. ඉන් අනතුරුව එය අනෙක් කණ්ඩායමට ද පවරනු ලැබේ. කණ්ඩායම් දෙකම මෙම කාර්යය සිදු කිරීමෙන් අනතුරුව එම ඇවිදීමේ ක්‍රියාව සම්බන්ධව සිසුන්ගෙන් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව පහත කාරණය පිළිබඳව ඔවුන්ගේ අදහස්වලින්ම අවධාරණය කරවයි.

**" එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොරව අප විසින් කරනු ලබන චලන ස්වභාවික චලන වේ."**

උදා - ඇවිදීම

ඉන්පසුව නැවත ළමුන් පිරිස පන්ති කාමරයේ එක් පසෙකට යොමු කරවයි. ඉන් පසු ඔවුන්ට පහත විස්තරය කියයි.

'' ඔබ ඉදිරියේ අඩි පහක් පමණ පළල පාලමක් තිබෙනවා. ඒ පාලමෙන් යට කිඹුල්ලු ඉන්නවා. පාලමෙන් ඕන කෙනෙකුට එගොඩ වෙන්න පුළුවන්. හැබැයි කොන්දේසි කිහිපයක් තියෙනවා. මේ පාලමෙන් එගොඩ වෙන්න පුළුවන් සාමාන්‍ය විදියට ඇවිදගෙන ගිහින් නෙවෙයි. තමාගේ ස්වාභාවික ගමන් තාලය නොවන ඕනෑම වෙනත් ඕනෑම විදියකට ඇවිදින්න ඔබට පුළුවන්. අනෙක් කාරණය තමයි, පෙර අයෙක් ගිය ආකාරයකට තවත් අයෙකුට ගමන් කරන්න බෑ.''

මෙසේ සිසුන් ගමන් ගත් ගමන් රටා අයත් වන්නේ නිර්මිත චලනවලට බව පෙන්වා දෙයි. ඒ අනුව,

**"නිර්මිත චලන යනු තම පරිකල්පනය මොහයවා උත්පාදනය කරනු ලබන චලන"** වන බව සිසුන්ට පැහැදිලි කළ යුතු ය.

මීළඟට සිසුන් හට යම් තාල සහිත සංගීත ඛණ්ඩයක් ශ්‍රවනය කිරීමට අවස්ථාව සලසයි. ඉන් පසු එහි තාලය හඳුනාගෙන එහි තාලයට අනුව පාද තබමින් අවකාශයේ ඇවිදීමට අවස්ථාව ලබා දෙයි. එසේ ඇවිදින අතර එක් වරම විසිල් හඬක් නිකුත් කර, ඇවිදීම රෝබෝ යන්ත්‍රයක ආකාරයට සිදු කළ යුතු බව ප්‍රකාශ කරයි. තාලයට අනුව රෝබෝ වරුන් මෙන් සිසුන්ට ඇවිදීමට කියයි. මෙසේ යම් තාලයකට අනුවද අපට ශරීරය චලනය කරමින් ක්‍රියාත්මක විය හැකි බව පැහැදිලි කරයි.

මෙසේ **"නිශ්චිත (ගණිතමය) රටාවකට අනුව සිදු කරනු ලබන චලන තාලානුකූල චලන වේ."** යන්න පැහැදිලි කරයි.

<u>නිර්මිත චලන රූපණයේ දී වැදගත් වේ.</u>

- විවිධ වර්ගයේ චරිත රූපණයේ දී.
- විවිධ ශෛලියේ නාට්‍යවල රඟපෑමේදී
- විවිධ ඉරියව් ප්‍රදර්ශනයේදී

<u>එසේම නිර්මිත හා තාලානුකූල චලන මගින් විවිධ අදහස් ප්‍රකාශ කළ හැකිය.</u>

- රංග රචනයේදී  විවිධ චලන නිර්මාණය කරන්නේ මෙවන් චලන මගිනි.
- නාට්‍යවල විවිධ ගීත හා සංගීත ඛණ්ඩවලට අදාළව සිදු කරන නර්ථනානුකූල චලනයන් මෙම චලන මගින් සිදු කරයි.

(කුවේණී, මනමේ, කදා වළලු, දික්තල කාලගෝල ආදී නාට්‍ය නිදසුන් සපයයි.)

පැවරුම

- සිසුන් කණ්ඩායම් කර නිර්මිත චලන මගින් විවිධ රූපරටා හා හැඩතල නිර්මාණය කරවීම.
- නිශ්චල ඡායාරූප නිර්මාණය කරවීම
- සංගීත ඛණ්ඩවලට අනුව නර්ථනයේ යෙදවීම.